# ප්‍රාථමික අධ්‍යාපනයේ තුන්වන ප්‍රධාන අවධියේ සිසුන්ගේ සාක්ෂරතා නිපුණතා ප්‍රවීණත්වය කරා සංවර්ධනයේ දී භාවිත කරන ඉගෙනුම්-ඉගැන්නුම් ක්‍රමවේදවල ගුණාත්මකභාවය පිළිබඳ අධ්‍යයනයක්

# A study on the quality of the methods adopted during the teaching-learning process in developing competencies related to literacy at the key stage 3 in primary education


එස්. ඒ. පී. එස්. ජයමහ

**(B.A ,Dip.in Ed.,(Dist), M.Ed.)**


**M.Phil/2004/09**


541147


අධ්‍යාපන දර්ශනපති උපාධි අවශ්‍යතාපූර්ණය සඳහා ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ නිබන්ධනය


අධ්‍යාපන පීඨය

කොළඹ විශ්වවිද්‍යාලය



UCLIB

541147

University of Colombo Library


2007 පෙබරවාරි

## සාරාංශය


ප්‍රාථමික අධ්‍යාපනයේ තුන්වන ප්‍රධාන අවධියේ සිසුන්ගේ සාක්ෂරතා නිපුණතා ප්‍රවීණත්වය කරා සංවර්ධනයේ දී භාවිත කරන ඉගෙනුම්-ඉගැන්නුම් ක්‍රමවේදවල ගුණාත්මක භාවය පිළිබඳ ව සොයා බැලීම මෙම පර්යේෂණ අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වේ. සාක්ෂරතාව රටක සංවර්ධනයේ පූර්වාවශ්‍යතාවයකි. අනෙකුත් සියලු ම විෂයයන්හි නිපුණතා අත්පත් කර ගැනීම සඳහා ද සාක්ෂරතා නිපුණතා අත්පත් කර ගැනීම වැදගත් වේ. සංවර්ධනය සඳහා උරදීමට මෙන්ම, ලෝකය අත්පත් කර ගැනීමට භාෂාව ප්‍රමුඛ මෙවලමක් වන නිසා මෙම අධ්‍යයනය නිපුණතා පාදක ප්‍රාථමික විෂයමාලාවේ ගුණාත්මක වර්ධනයට බෙහෙවින් ම එලදායී වනු ඇත.

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ ඉටුකර ගැනීම සඳහා පළමුව ඉගෙනුම්-ඉගැන්නුම් ක්‍රියාවලියේ දී සාක්ෂරතා නිපුණතා ප්‍රවීණත්වය සංවර්ධනය සඳහා යොමුවන සිසු ක්‍රියාකාරිත්වය සොයා බැලුණි. දෙවනුව සිසු සාක්ෂරතා නිපුණතා ප්‍රවීණත්ව සංවර්ධනය සඳහා යොමුවන ගුරු ක්‍රියකාරිත්වය පිළිබඳ ව විමසා බැලුණි.

ඉහත අරමුණු ඉටුකර ගැනීම සඳහා පර්යේෂණ පිරිසැලසුමක් ලෙස ප්‍රත්‍යක්ෂ අධ්‍යයන ක්‍රමය භාවිත කරන ලදී. ඒ අනුව ගිරිඋල්ල අධ්‍යාපන කලාපයේ, අලව්ව අධ්‍යාපන කොට්ඨාසයෙන් නාගරික, ග්‍රාමීය පිහිටීම සලකා පාසල් හතක් තෝරා ගනු ලැබුණි. එම පාසල්වල 5 ශ්‍රේණි ගුරුවරු හත් දෙනෙක් සහ එක් පාසලකින් අහඹු ලෙස තෝරා ගත් සිසුන් පස්දෙනා බැගින් සිසුන් 35 දෙනෙකුගෙන් අධ්‍යයන නියැදිය සමන්විත විය. මෙහිදී දත්ත රැස් කිරීමට ප්‍රධාන වශයෙන්ම නිපුණතා තක්සේරු උපකරණ සැකසූ අතර ක්ෂේත්‍ර සටහන් තබා ගැනුණි. ඊට අමතර ව ගුරුවරුන් සඳහා ප්‍රශ්නාවලී හා ගුරු සම්මුඛ සාකච්ඡා මගින් ද දත්ත රැස්කර ගැනුණි. එසේම ගුරු තක්සේරු වාර්තා, පාසල් පිළිබඳ විස්තර, ඉගෙනුම් ද්‍රව්‍ය, පාඩම් සටහන් වැනි ද්‍රව්‍ය ද පරිශීලනය කරන ලදී.

ප්‍රධාන අරමුණුවලට අදාළ ව දත්ත විශ්ලේෂණය ගුණාත්මක සහ ප්‍රමාණාත්මක ප්‍රවේශ දෙකෙහි සංකලනයෙන් සිදු කරන ලදී. පාසල් හතෙහි සිදුකරන ලද ප්‍රත්‍යක්ෂ අධ්‍යයන හතෙන් පළමුව නියැදියේ පසුබිම් තොරතුරුත්, දෙවනුව ශිෂ්‍ය නිපුණතා ප්‍රවීණත්ව මට්ටමත්, තෙවනුව ගුරු ක්‍රියාකාරිත්වයත් යන තේමා ඔස්සේ වගු භාවිතයෙන් විශ්ලේෂණය කර පාසල් හත හරහා සසඳමින් අනාවරණ දක්වා ඇත.

ඉගෙනුම්-ඉගැන්නුම් ක්‍රියාවලියේ දී සාක්ෂරතා නිපුණතා ප්‍රවීණත්ව සංවර්ධනය සඳහා යොමුවන සිසු ක්‍රියාකාරිත්වය සෙවීමට තුන්වන ප්‍රධාන අවධියට ප්‍රවේශ වීමේ දී හා වාරයක් ගියපසු සිසු සාක්ෂරතා නිපුණතා තක්සේරු කරන ලදී. මෙහිදී ගුරුවරයා හා පර්යේෂිකාව අතර සිසු සාක්ෂරතා නිපුණතා අත්පත්කර ගැනීමෙහි යම් වෙනසක් පෙනුණත් ඉගෙනුම්-ඉගැන්නුම් ක්‍රියාවලිය තුළින් ශිෂ්‍ය නිපුණතා සංවර්ධනය වීමක් තිබූ බව පෙනුණි.

මෙලෙස සිසු සාක්ෂරතා නිපුණතා ප්‍රවීණත්වය කරා සංවර්ධනයේ දී මව්බස පාඩම්වල ගුරු ක්‍රියාකාරිත්වය විමසා බලන විට ඉතා සතුටුදායක, සතුටුදායක, තරමක් සතුටුදායක, සතුටුදායක නොවූ මට්ටම හතරක් ඔස්සේ අනාවරණ දැක්විය හැකිය. ගුරුවරු ඉතා සතුටුදායක මට්ටමින් කිසිදු ඉගැන්නුම් ක්‍රමවේදයක් භාවිත නොකළහ. නමුත් විෂයනිර්දේශය හා වාර සටහන පරිශීලනයේ දී සතුටුදායක මට්ටමින් කටයුතු කළහ.

එසේම කාල කලමනාකරණය, පාඩම පියවරෙන් පියවර සංවර්ධනය කිරීම, ගුරු පෞරුෂය, අභිප්‍රේරණ භාවිතයෙන් සිසු අවධානය රඳවා තබා ගැනීම, පාඩම් තුළින් නිපුණතා සංවර්ධනය කිරීම, කාර්ය-නැඹුරු ක්‍රියාකාරකම් දියත් කිරීම හා විවිධ තක්සේරු ක්‍රම භාවිතයේ දී ගුරුවරු තරමක් සතුටුදායක මට්ටමකින් කටයුතු කළහ.

ගුරු ක්‍රියාකාරිත්වයෙ හි සතුටුදායක නොවූ ඉගෙනුම්-ඉගැන්නුම් ක්‍රමවේද රැසක් ද අනාවරණය වුණි. කිසිදු ගුරුවරයෙක් ළඟ විධිමත් සූදානම් සටහනක් නොවුණි. ඔවුහු නවතාවයෙන් යුතු පාඩම් ප්‍රවේශ භාවිත නොකළ අතර සම්ප්‍රදායික ඉගෙනුම්-ඉගැන්නුම් ආධාරක පමණක් භාවිත කළහ. බහුතරයක් පාඩම් ගුරු කේන්ද්‍රීය වූ අතර සිසු-සිසු ක්‍රියාකාරකම් සඳහා ඉඩ සැලසුණේ ඉතාමත් අඩුවෙනි. පන්තිකාමරය තුළ බහුලව සිදුවූ අසුන්ගත ක්‍රියාකාරකම්වල කණ්ඩායම් ක්‍රමයට ඉතා අඩු අවධානයක් යොමු කළ අතර එළිමහන් පරිසරය ද ඉතාමත් අඩුවෙන් භාවිත කළහ. ගුරුවරුන් පන්තිකාමරය තුළ අපේක්ෂිත කාර්යයෙන් බැහැර හැසිරීම් කලමනාකරණය කරන්නට දැක්වූ අවධානය අඩුය. එසේම ගුරුවරු දුර්වල සිසුන්ට වඩා සුහග සිසුන්ට වැඩි අවධානයක් දැක්වූහ. නිපුණතා සංවර්ධනයේ දී දැනුම ක්ෂේත්‍රය වර්ධනයට පමණක් වැඩි අවධානයක් දැක්වූහ.

මෙම අධ්‍යයන අනාවරණ අනුව ශිෂ්‍ය සාක්ෂරතා නිපුණතා සංවර්ධනය කිරීමට ගුරු ක්‍රියාකාරිත්වයෙහි වැඩිදියුණු විය යුතු අංග ගණනාවක් ම පෙනී යයි. එසේම ගුරු පුහුණුව, අධීක්ෂණ වැඩපිළිවෙල වැඩිදියුණු කළ හැකි යෝජනා ද මෙමගින් ඉදිරිපත් කර ඇත.

**Abstract**

This objective of this research was to study the quality of teaching-learning methods adopted in developing competencies related to literacy during the Key Stage 3 of primary education. Literacy is an essential element for individual and societal development. Teaching-learning process implemented towards improving literacy during the primary education span is the most important factor in making the literate citizen and laying the foundation for further learning.

The study focused on the teacher as a planner of the teaching-learning process and the teaching-learning methods adopted in implementation of the mother tongue curriculum in Key Stage 3. Student participation in the teaching-learning process and the attainment of competencies related to literacy within a given time period was also assessed.

The case study design was adopted as it was necessary to study the teaching-learning process in detail. The sample schools were selected from Allawwa Education Division of the Giriulla Education Zone. Schools from both urban, rural localities were selected. Thus the sample comprised of seven Grade 5 teachers and five students from each teacher's class.

Collection of data was by keeping field notes, administering questionnaires to teachers, interviewing the teachers and assessing student competencies by the use of a range of tools.

Cross case analysis is presented on a thematic structure developed through detailing out the teaching-learning process. Literacy assessments were analysed using quantitative methods while the steps in the teaching-learning process was analysed qualitatively. An improvement in literacy was shown during the first school term in which the study was conducted when compared with the assessment made at the entry to the Key Stage 3. However, the degree of improvement was not satisfactory when the measurement of specific competencies were studied in depth. Added to this the parallel assessments made by the teachers were always found to be over estimations thus indicating problems related to implementation of a system of competency-based education.

## Abstract

This objective of this research was to study the quality of teaching-learning methods adopted in developing competencies related to literacy during the Key Stage 3 of primary education. Literacy is an essential element for individual and societal development. Teaching-learning process implemented towards improving literacy during the primary education span is the most important factor in making the literate citizen and laying the foundation for further learning.

The study focused on the teacher as a planner of the teaching-learning process and the teaching-learning methods adopted in implementation of the mother tongue curriculum in Key Stage 3. Student participation in the teaching-learning process and the attainment of competencies related to literacy within a given time period was also assessed.

The case study design was adopted as it was necessary to study the teaching-learning process in detail. The sample schools were selected from Allawwa Education Division of the Giriulla Education Zone. Schools from both urban, rural localities were selected. Thus the sample comprised of seven Grade 5 teachers and five students from each teacher`s class.

Collection of data was by keeping field notes, administering questionnaires to teachers, interviewing the teachers and assessing student competencies by the use of a range of tools.

Cross case analysis is presented on a thematic structure developed through detailing out the teaching-learning process. Literacy assessments were analysed using quantitative methods while the steps in the teaching-learning process was analysed qualitatively. An improvement in literacy was shown during the first school term in which the study was conducted when compared with the assessment made at the entry to the Key Stage 3. However, the degree of improvement was not satisfactory when the measurement of specific competencies were studied in depth. Added to this the parallel assessments made by the teachers were always found to be over estimations thus indicating problems related to implementation of a system of competency-based education.

The teacher personality and a range of other aspects of the teaching-learning process was analysed using a qualitative approach. The analysis was done across four levels of satisfactoriness such as highly satisfactory, satisfactory, somewhat satisfactory and unsatisfactory. Adhering to syllabi and term plan was satisfactory. Time management, lesson development, teacher personality, student motivation strategies, assessment strategies were somewhat satisfactory. However, teaching methods adopted were at an unsatisfactory level with lack of preparation and lesson planning, adoption of teacher centred strategies, lack of innovative teaching aids, limited opportunities for peer learning, emphasis on desk work and paying less attention towards low achievers.

The outcomes of the study lay out a range of aspects that needs to be improved in the teacher's role in fostering literacy. A number of recommendations are made for teacher development and supervision of the teaching-learning process by zonal as well as at school level.